**මධ්‍යම පළාත් මුල් ළමාවිය සංවර්ධන ඒකකයේ ආදර්ශ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ මුල් ළමාවිය සංවර්ධන සහය උපදේශිකා(සහය ගුරු) / දිවාසුරැකුම් මධ්‍යස්ථාන පාලිකා තනතුරට බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවීමට අදාල තොරතුරු**

මධ්‍යම පළාත් මුල් ළමාවිය සංවර්ධන ඒකකය යටතේ කුණ්ඩසාලේ නව නගරයේ අංක 2A, ස්ථානයේ ආරම්භ කර පවත්වාගෙන යනු ලබන පළාත් ආදර්ශ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන පාලිකා/ සහය උපදේශිකා තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරාලන අයවලුන්ගෙන් සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

***තනතුර***

මුල් ළමාවිය සංවර්ධන සහය උපදේශිකා (සහය ගුරු) / දිවාසුරැකුම් මධ්‍යස්ථාන පාලිකා (කොන්ත්‍රාත් පදනම මත)

***වයස***

2025.01.15 දිනට වයස අවුරුදු 18 නොඅඩු වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතු වේ.

***දීමනාව***

මෙම තනතුර රජයේ ස්ථිර තනතුරක් නොවන අතර කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලබයි. බඳවා ගන්නා සුදුසුකම්ලාභියා මාස 06ක පරිවාස කාලයකට යටත් වන අතර ආරම්භක දීමනාව ලෙස රු:20,000.00 දීමනාවක් ගෙවනු ලැබේ. ඉන් අනතුරුව කාර්යයසාධනය සලකා බලා පාලක කමිටුව විසින් වාර්ෂිකව දීමනාව සංශෝධනය කරනු ලැබේ.

***සුදුසුකම්***

අ.පො. ස සාමාන්‍ය පෙල විභාගය සඳහා ගණිතය සහ මව් භාෂාව ඇතුලත්ව සම්මාන තුනක් සහිතව වැඩ හයක් සමත් විය යුතු වේ.

සහ

ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් හෝ රජයේ පිළිගන්නා ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා සහතික පත්‍ර හෝ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

දෙමළ භාෂාව සහ පරිගණක භාවිතය පිළිබඳව හදාරා තිබීම විශේෂ සුදුසුකමක් සේ සලකනු ලබයි

***වෘත්තීය සුදුසුකම්***

මුල් ළමාවිය සංවර්ධන ඒකකය විසින් පිළිගන්නා ආයතනයකින් ලබා ගන්නා ලද මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ උපාධිය හෝ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.

හෝ

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන එක් අවුරුදු සහතික පත්‍ර පාඨමාලාව, දෑ අවුරුදු උසස් සහතික පත්‍ර පාඨමාලාව හදාරා සහතිකය ලබා තිබීම.

***පළපුරුද්ද***

මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක දිවා සුරැකුම් මධ්‍යස්ථාන පාලිකාවක වශයෙන් වසරකට නොඅඩු සේවා පලපුරුද්දක් ලබා තිබීම.

සහ

මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක උපදේශිකාවක (පෙර පාසැල් ගුරුවරියක) වශයෙන් සේවය කර ඇති පලපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

***කායික සුදුසුකම්***

අයදුම්කාරිය මනා සහ විශිෂ්ඨ චරිතයකින් සහ තනතුරේ රාජකාරි කිරීමට ප්‍රමාණවත් මනා කායික සහ මානසික සෞඛ්‍ය තත්ත්වයකින් හෙබි තැනැත්තියක් විය යුතු වේ.

**වෙනත්**

අයදුම්කාරිය ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු වේ.

අයදුම්පත කැඳවන අවසන් දිනයට (2025.01.15 දිනට) පූර්වාසන්න වසර 05 ක අඛණ්ඩව මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිය තිබිය යුතු වේ. ( සම්මුඛ පරීක්ෂණයේදී ග්‍රාම නිලධාරි සහතිකය මගින් සනාථ කළ යුතු වේ )

තනතුර සඳහා  අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම අයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු වේ. එමෙන්ම අයදුම්කරුවන් එම සුදුසුකම පිළිබඳ සහතික පත් සම්මුඛ පරීක්ෂණයේදී මුල් පිටපත් සහ සහතික කරන ලද පිටපත් සමගින් ඉදිරිපත් කළ යුතු වේ.

***අයදුම්පත්‍ර***

අයදුම්කරුවන් සියලු විස්තර සමඟ මෙහි සඳහන් ආකෘතියට සකස් කරන ලද අයදුම්පතක් අධ්‍යාපන සහතික, උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පතහි පිටපතක් සහ පළපුරුද්ද දැක්වෙන සහතිකවල සහතික කළ පිටපත් සමගින්. අධ්‍යක්ෂ, පළාත් මුල් ළමාවිය සංවර්ධන ඒකකය, අංක 2A, නව නගරය, කුණ්ඩසාලේ යන ලිපිනයට 2025/01/15 දිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු වේ. අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවර **"මුල් ළමාවිය සංවර්ධන සහය උපදේශිකා (සහය ගුරු) / දිවාසුරැකුම් මධ්‍යස්ථාන පාලිකා තනතුර සඳහා බඳවා ගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතු වේ.

# පළාත් මුල් ළමාවිය සංවර්ධන ඒකකය - මධ්‍යම පළාත

මධ්‍යම පළාත් ආදර්ශ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය සඳහා මුල් ළමාවිය සංවර්ධන සහය

උපදේශිකා (සහය ගුරු) / දිවාසුරැකුම් මධ්‍යස්ථාන පාලිකා තනතුරට බඳවාගැනීමේ අයදුම්පත්‍රය

| දිස්ත්‍රික්කය | | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | |
|---|---|---|---|

**01.** අයදුම්කරු පිළිබඳ මූලික තොරතුරු -

**1.1** සම්පූර්ණ නම (සිංහල) –

........................................................................................................................................

........................................................................................................................................

**1.2** සම්පූර්ණ නම (ඉංග්‍රීසි) –

........................................................................................................................................

........................................................................................................................................

**1.3** මුලකුරු සමඟ නම (සිංහල) –

........................................................................................................................................

**1.4** මුලකුරු සමඟ නම - (ඉංග්‍රීසි කැපිටල්)

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |

**1.5** ජාතික හැඳුනුම්පත් අංකය - .......................................... **1.6** උපන් දිනය -..........................

**1.7** පෞද්ගලික ලිපිනය -

........................................................................................................................................

**1.8** දුරකථන අංකය - පෞද්ගලික - [ ] **WhatsApp** [ ]

**1.9** විද්‍යුත් තැපැල් ලිපිනය - ...............................................................................................

**02.** අයදුම්කරුගේ අධ්‍යාපන සුදුසුකම්

**2.1** අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය ..............

| විෂය | සමාර්ථය | වර්ෂය | විෂය | සමාර්ථය | වර්ෂය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

*(සහතික කළ පිටපතක් අමුණන්න)*

**2.2 අ.පො.ස (උසස් පෙළ)** **විභාගයට පෙනී සිටි වර්ෂය ...............**

| විෂය | සමාර්ථය | විෂය | සමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |

*(සහතික කළ පිටපතක් අමුණන්න)*

**2.3 වෙනත් අධ්‍යාපන සුදුසුකම්**

| | පාඨමාලාවේ නම (උපාධි/ ඩිප්ලෝමා / සහතිකපත්‍ර) | ප්‍රදානය කළ ආයතනය | වර්ෂය |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |

*( සම්මුඛ පරීක්ෂණයේදී සහතිකපත් ඉදිරිපත් කළ යුතු වේ)*

**2.4 හදාරා ඇති මුල් ළමාවිය සංවර්ධන උපාධි/ ඩිප්ලෝමා / සහතිකපත්‍ර පාඨමාලා හෝ පාඨමාලාවන්**

| | පාඨමාලාවේ නම ( උපාධි / ඩිප්ලෝමා / සහතිකපත්‍ර) | ප්‍රදානය කළ ආයතනය | වර්ෂය |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |

*( සහතිකවල සහතික කරන ලද පිටපත් අමුණන්න)*

## 03 අයදුම්කරුගේ වෘත්තීය සුදුසුකම්

**03.1 ඔබ දැනටතමත් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක සේවය කරන්නේ නම් ඒ පිළිබඳ තොරතුරු.**

| | මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ නම | ලියාපදිංචි අංකය | දැනට සේවය කරනු ලබන තනතුර | | | |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ළමාවිය සංවර්ධන උපදේශිකාවක් වශයෙන් | කාල සීමාව | දිවා සුරැකුම් මධ්‍යස්ථාන පාලිකාවක් වශයෙන් | කාල සීමාව |
| 01 | | | | | | |

*(සේවා සහතික වල සහතික කල පිටපත් අමුණන්න)*

**03.2** ඔබ විසින් සේවය කරන ලද මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල තොරතුරු

| | මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ නම | ලියාපදිංචි අංකය | සේවය කරනු ලැබූ තනතුර (මුල් ළමාවිය සංවර්ධන උපදේශිකා/දිවා සුරකුම් මධ්‍යස්ථාන පාලිකා) | කාල සීමාව | |
|---|---|---|---|---|---|
| | | | | සිට | දක්වා |
| 01 | | | | | |
| 02 | | | | | |
| 03 | | | | | |
| 04 | | | | | |
| 05 | | | | | |

*(සේවා සහතික වල සහතික කල පිටපත් අමුණන්න)*

**ඉහත සඳහන් තොරතුරු සත්‍ය සහ නිවරදි බව ප්‍රකාශ කරමි.**

**දිනය ..................................................** **අත්සන ..............................................**